// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශේෂ

අංක 2311/55 - 2022 දෙසැම්බර් මස 23 වැනි සිකුරාදා - 2022.12.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී-බී 94/47 (viii).

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6(2) (ආ) සහ 21(2) (ආ) වගන්ති යටතේ වූ නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2)(ආ) වගන්තිය සහ 21(2)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, මේ නියමය මගින් -

(අ) ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ඉඩම් ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවටත්, එය “මහියංගණ රජමහා විහාර පූජා භූමිය” යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බවටත් ප්‍රකාශයට පත් කරනු ලැබේ; සහ

(ආ) නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ඉහත ප්‍රකාශයට පත් කරනු ලැබූ මහියංගණ රජමහා විහාර පූජා භූමිය සම්බන්ධයෙන් පරිබාහිර සැලැස්මක් සකස් කළ යුතු බවට විධානය කරනු ලැබේ.

**ප්‍රසන්න රණතුංග (පා.ම.)**
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2022 දෙසැම්බර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

**මහියංගණ රජමහා විහාර පූජා භූමිය**

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, මහියංගණය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බින්තැන්න කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක 3ඩී, පූජා නගරය යන ග්‍රාම නිලධාරි වසමේ පිහිටි හෙක්ටයාර් 20.4268 ක විශාලත්වයෙන් යුක්ත සර්වේයර් ජනරාල්වරයාගේ 2021 අගෝස්තු මස 20 වැනි දිනැති අනුරේඛණ අංක B/MHY/2021/290 තුළ කැබලි අංක A වශයෙන් නිරූපිත පහත සඳහන් පරිදි මායිම් වූ බිම් ප්‍රදේශය :-

**කැබලි අංක :** A

*උතුරට* : කලාප 11 (කොටසක්) සහ කලාප 1
*නැගෙනහිරට* : කලාප 11 (කොටසක්), කැබලි අංක B සහ කලාප 5
*දකුණට* : කැබලි අංක B, කලාප 5 සහ කලාප 11 (කොටසක්)
*බස්නාහිරට* : කලාප 11 (කොටසක්) සහ කලාප 1

EOG 12- 0295

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.